

පැළෑටි හා ගස්වැල්
3 , 4 , 5 වසර
පරිසරය
DIVISIONAL EDUCATION OFFICE REDEEMALIYADDA - MAHIYANGANAYA


# පැළෑටි හා ගස්වැල්


ස්වාභාවික පරිසරයේ ඇති ගස්වැල්, මිනිසා හා එකිනෙකට බද්ධව පවතී. නොයෙක් විවිධත්වයන්ගෙන් යුක්ත වූ ශාක වනාහි මිනිසාට විවිධාකාර ප්‍රයෝජන රැසක් සපයන, ස්වභාව ධර්මයා විසින් දායාද කරන ලද අපූර්වත ම අංගයකි. මේ නිසා මිහිතලයේ වෙසෙන මිනිසා ඇතුළු සියලු සත්ත්ව කොට්ඨාසයන්ට ශාක නොමැතිව ජීවයක් නොමැත.

වත්මන් යුගයේ මුදල් මූලික කර ගත් සමාජයක් තුළ පැළෑටි හා ගස්වැල්වලින් සමන්විත පරිසරය අඛණ්ඩව විනාශ කරමින් පවතී. මේ නිසා පරිසරයේ සමතුලිතතාවයට මහෝපකාරී වන ගස් වැල් රෝපණය කරමින් පරිසර සංරක්ෂණයට දායක වීම අප සතු යුතුකමකි.


ශාක වර්ගීකරණය කරමු.
ශාක
ගස්
වැල්
පඳුරු
පැළෑටි


ක්‍රියාකාරකම්
ශාක හඳුනා ගැනීම
ගස්
Back
කඳ ශක්තිමත්ව උසට වැඩෙන ශාක ගස් ලෙස හඳුන්වයි. උදාහරණ වශයෙන් කොස්, පොල්, තේක්ක, කොහොඹ, ආදිය ගත හැකිය.
කොහොඹ
තේක්ක
පොල්
කොස්


ගස්
ගසක ලක්ෂණ
❖ශක්තිමත් කඳක් ඇත.
❖ඇතැම් ශාකවල කඳ තුළ අරටුවක් ඇත.
❖උසට වැඩෙයි.
❖අතු බෙදී පවතී.
❖මුල් පොළොවට තදින් සම්බන්ධ වී ඇත.


ගස්වලට උදාහරණ
❖ කොස්
❖ පොල්
❖ තේක්ක
❖ කිතුල්
❖ අඹ
❖ දෙල්
❖ කුඹුක්
❖ නැදුන්
❖ හොර
❖ බුරුත
❖ පලු
❖ වීර
❖ කොහොඹ
❖ රබර්
කොස්
පොල්
තේක්ක
කිතුල්
අඹ
දෙල්
කුඹුක්
නැදුන්
හොර
බුරුත
පලු
වීර

# වැල්

Back

යම් ආධාරකයක් වටේ එතෙමින් වැඩෙන ශාක වැල් ලෙස හඳුන්වයි. උදාහරණ වශයෙන් කරවිල, වැල්දොඩම්, සමන්පිච්ච, බුලත් ආදිය ගත හැකිය.

බුලත්



සමන්පිච්ච



වැල් දොඩම්



කරවිල



# වැල්

## වැලක ලක්ෂණ

❖ශක්තිමත් කඳක් නැත.

❖බොහෝවිට ආධාරකයක එතී ඉහළ නගියි.

❖විටෙක පොළොව මත ගමන් කරයි.




වැල්වලට උදාහරණ
❖ බුලත්
❖ නාගවල්ලි
❖ ගම්මිරිස්
❖ තිප්පිලි
❖ වැල්දොඩම්
❖ මෑකරල්
❖ වට්ටක්කා
❖ කොමඩු
❖ මිදි
❖ ලබු
❖ වැල්පෙනෙල
❖ වැටකොළු
❖ කරවිල
❖ බතල
❖ කටරොඩු
❖ කිරි අගුණ
❖ දඹල
❖ ගිරිතිල්ල
❖ පිපිඤ්ඤා
❖ හාතවාරිය
❖ පූහුල්
බුලත්
නාගවල්ලි
ගම්මිරිස්
තිප්පිලි
වැල්දොඩම්
මෑකරල්
වට්ටක්කා
කොමඩු
මිදි
ලබු
වැල්පෙනෙල
වැටකොළු
කරවිල
බතල
කටරොඩු
කිරි අගුණ
දඹල
ගිරිතිල්ල
පිපිඤ්ඤා
හාතවාරිය

## පැලෑටි

Back

ශක්තිමත් බවෙන් අඩු උසින් අඩු ශාක පැලෑටි ලෙස හඳුන්වයි. උදාහරණ වශයෙන් පොල්පලා, කුප්පමේනිය, මොණරකුඩුම්බිය, කුඩලු ආදිය ගත හැකිය.



කුඩලු



මොණරකුඩුම්බිය



කුප්පමේනිය



පොල්පලා

# පැළෑටි

## පැළෑටියක ලක්ෂණ

- ශක්තිමත් කඳක් නැත.
- කඳ සිහින් ය.
- උසට නොවැඩෙයි.
- අතු බෙදී පවතී.
- මූල පද්ධතිය සිහින් ය.




පැළෑටිවලට උදාහරණ
❖ කුප්පමේනිය
❖ පොල්පලා
❖ මිරිස්
❖ වම්බටු
❖ තක්කාලි
❖ ඉරිවේරිය
❖ තම්පලා
❖ මදුරුතලා
❖ නිදිකුම්බා
❖ මොණරකුඩුම්බිය
❖ දාස්පෙතියා
❖ බණ්ඩක්කා
❖ කිකිරිඳිය
❖ ඉරමුසු
❖ නීරමුල්ලිය
❖ පිටවක්කා
කුප්පමේනිය
පොල්පලා
මිරිස්
වම්බටු
තක්කාලි
ඉරිවේරිය
තම්පලා
මදුරුතලා
නිදිකුම්බා
මොණරකුඩුම්බිය
දාස්පෙතියා
බණ්ඩක්කා

# පඳුරු

Back

උසින් අඩු අතු හොඳින් බෙදී ඇති, ප්‍රදේශයක පැතිරී ඇති ශාක පඳුරු ලෙස හඳුන්වයි. උදාහරණ වශයෙන් රත්මල්, බෝවිටියා, තේ, කිරිඉද්ද, ආදිය ගත හැකිය.

කිරි ඉද්ද



තේ



බෝවිටියා



රත්මල්



# පඳුරු

## පඳුරක ලක්ෂණ

- ශක්තිමත් කඳක් නැත.
- උසට නොවැඩෙයි.
- පොළොවේ සිට ම අතු විහිදුණු ආකාරයක් දක්නට ලැබේ.
- මොටෙයියන් මගින් පැළ ලබා ගත හැකි ය.





පඳුරුවලට උදාහරණ
❖ කෙසෙල්
❖ රම්පේ
❖ කහ
❖ ඉඟුරු
❖ කෝමාරිකා
❖ ඇන්තූරියම්
❖ සේර
❖ ගොයම්
❖ උක්
❖ උණ
❖ මානා
❖ ඊතණ
❖ අන්නාසි
❖ ලීක්ස්
❖ ලූනු
❖ කැරට්
❖ වැටකෙයියා
❖ ඉලුක්
❖ හබරල
❖ පන්
❖ බීට්
❖ කුරක්කන්
❖ මෙනේරි
කෙසෙල්
රම්පේ
කහ
ඉඟුරු
කෝමාරිකා
ඇන්තූරියම්
සේර
ගොයම්
උක්
උණ
මානා
ඊතණ
අන්නාසි
ලීක්ස්
ලූනු
කැරට්
වැටකෙයියා
ඉලුක්
හබරල
පන්


# ගසක් හා පැළෑටියක් අතර දක්නට ලැබෙන වෙනස්කම්

| ගස | පැළෑටිය |
|---|---|
| උසට වැඩෙයි. | උසට නොවැඩෙයි |
| කඳ ශක්තිමත් ය. | කඳ ශක්තිමත් නැත. |
| බොහෝ විට අරටුවක් දක්නට ලැබෙයි. | අරටුවක් දක්නට නොලැබෙයි. |
| දිගුකාලීනව පවතී. | කෙටි කාලයකින් විනාශ වෙයි. |
| ශක්තිමත් මූල පද්ධතියක් ඇත. | ශක්තිමත් බවින් අඩු මූල පද්ධතියක් ඇත. |






ක්‍රියාකාරකම්
ක්‍රියාකාරකම්
ක්‍රියාකාරකම් I
ක්‍රියාකාරකම් II
පහත දක්වා ඇති ශාකයන් මවුසය මගින් රැගෙන ගොස් එම ශාකය අදාල කාණ්ඩයට දමන්න.
Reset
දං
තේක්ක
මෑ
මොණරකුඩුම්බිය
මදු
බෝවිටියා
දෙල්
කොස්
පිල
රත්මල්
පිටවක්කා
කොහොඹ
පෝට
නැදුන්
කරවිල
පොල්පලා
ලුණුවිල
රසකිඳ
කුප්පමේනිය
ඉද්ද
වෘක්ෂ
වැල්
පැළෑටි
පඳුරු


මලක කොටස්
කලංකය
රේණු
කීලය
පෙති
ඩිම්බ කෝෂය
මනිපත්‍ර
නටුව

ක්‍රියාකාරකම්

# ක්‍රියාකාරකම්

ක්‍රියාකාරකම් I ක්‍රියාකාරකම් II

● පහත දක්වා ඇති මල් වර්ග පිළිබඳ නිවැරදි ප්‍රකාශය දී ඇති පිළිතුරු තුළින් තෝරන්න.



අරලිය මල් තනි මල් වශයෙන් පිපේ.

අරලිය මල් පොකුරු මල් වශයෙන් පිපේ.



වඩාත් සුවඳ හමන මල් වර්ගයක් වන්නේ පිච්ච මල් ය.

පිච්ච මල් වලට වඩා ඉද්ද මල් සුවඳින් වැඩි ය.



වද මල් පොකුරු මල් වශයෙන් පිපේ.


වද මල් තනි මල් වශයෙන් පිපේ.



මී මැස්සා මල්වලට හානි කරන සතෙකි.

මී මැස්සා මල්වලට හානි කරන සතකු නොවේ.


ගසක කොටස්
ක්‍රියාකාරකම්
මල්
අතු
ගෙඩි
මුල්
කඳ
මුල්
කඳ
අතු
මල්
ගෙඩි
පත්‍ර


පත්‍රයක කොටස්
පත්‍ර අග්‍රය
පැති නාරටි
පත්‍ර දාරය
මැද නාරටිය
පත්‍ර තලය
නටුව



ක්‍රියාකාරකම්
බීජ හඳුනා ගැනීම
බීජ
බීජ ව්‍යාප්තිය
සුළඟින් ශාක බෝවන ආකාරය
හොර, ගම්මාලු, ඇට්ටෝනියා, ඉළුක්, කපු, අගුණ, වරා, ඉඹුල්, ඕකිඩ් වර්ග වැනි බීජ සුළඟේ පාවී යයි.
හොර
Back


ක්‍රියාකාරකම්
බීජ හඳුනා ගැනීම
බීජ
බීජ ව්‍යාප්තිය
ජලයෙන් ශාක බෝවන ආකාරය
කුඹුරු ඇට, පොල්, පුවක්, කොට්ටම්බා, අඹ, කජු වැනි බීජ ජලයේ පාවේ. ඕලු, නෙලුම් වැනි ශාක ද ජලයේ පාවී යාමෙන් බෝවන ශාක වේ.
Back



ක්‍රියාකාරකම්
බීජ හඳුනා ගැනීම
බීජ
බීජ ව්‍යාප්තිය
සතුන් මඟින් ශාක බෝවන ආකාරය
තුත්තිරි, ඉළුක්, ඇපල, ගල්කුර, කරල් හැබෝ වැනි බීජ සතුන්ගේ ඇගේ ද මිනිසුන්ගේ ඇඳුම් වල ද ඇලවේ. ඒ ආකාරයට ඒවා වෙනත් තැන් වලට පැතිරෙයි. හිඹුටු, වී, කජු, කොස්, අඹ, දොඹ ආදිය කුරුල්ලන් වැනි සතුන් ආහාරයට ගැනීමේදී ව්‍යාප්ත වේ.
Back


ක්‍රියාකාරකම්
බීජ හඳුනා ගැනීම
බීජ
බීජ ව්‍යාප්තිය
ශාක මඟින් බීජ ව්‍යාප්ත වන ආකාරය
එඬරු, රබර්, මාර, කව්පි, කුඩලු, මඳටිය, ඔළිඳ වැනි බීජ පිපිරීම මඟින් විසිරී යයි.
බීජ රහිතව මුල් මඟින් ද පැළ හට ගනී. උදාහරණ ලෙස දෙල්, නෙල්ලි, බෙලි ආදිය ගත හැකිය.
Back

- බීජයක් පැලවීමේදී අපට අවස්ථා 3ක් දැකිය හැකිය.බීජයේ පොත්තෙන් පිටතට පැළෑටිය පිවිසීම, පස පසාරු කර ගැනීම, ආහාර ලබා ගැනීම.



- බීජ මගින් ශාක බෝවීම ඇතිවේ. බීජයක් පැළවීම සඳහා තෙතමනය, උෂ්ණත්වය, වාතය යන සාධක අවශ්‍ය වේ.



# තේමාව : පැළෑටි හා ගස් වැල්

- ශාකයක මුල්, කඳ, පත්‍ර, බීජ, ගෙඩි, කරල් සුවිශේෂිව අධ්‍යයනය







- ශාකයේ මුල් හටගෙන ඇති ස්ථානය
- මුල් බෙදී ඇති ආකාරය
- මුල් විහිදී ඇති දුර/ දිග ප්‍රමාණ

- පත්‍රවල හැඩය
- පත්‍ර නාරටි විහිදී ඇති ආකාරය

- බීජ පිහිටා ඇති ආකාර
- බීජවල ප්‍රමාණය, හැඩය, වර්ණය, බීජ සංඛ්‍යාව

- ලංකාවට පමණක් ආවේනික ගස් වැල් විශාල ප්‍රමාණයක් ඇත.
- එහෙත් වර්තමානයේ මෙම ගස් වැල් විනාශ වෙමින් පවතී. වනාන්තර විනාශ කිරීම, විදේශීය ශාක වගාකිරීම එයට හේතු වෙයි.
- *ශ්‍රී ලංකාවට පමණක් ආවේනික වූ ශාක කිහිපයක්,*
  බෝවිටියා, ඉඳි, ගොඩපර, කෙකටිය, කුඹුක්, රුක්අත්තන, වල් කදුරු, දොඹ, කුරුඳු

- ලංකාවට පමණක් ආවේනික ගස් වැල් විශාල ප්‍රමාණයක් ඇත.
- එහෙත් වර්තමානයේ මෙම ගස් වැල් විනාශ වෙමින් පවතී. වනාන්තර විනාශ කිරීම, විදේශීය ශාක වගාකිරීම එයට හේතු වෙයි.
- *ශ්‍රී ලංකාවට පමණක් ආවේනික වූ ශාක කිහිපයක්,*
  බෝවිටියා, ඉඳි, ගොඩපර, කෙකටිය, කුඹුක්, රුක්අත්තන, වල් කදුරු, දොඹ, කුරුඳු


ඓතිහාසික වටිනාකමක් ඇති ශාක
ක්‍රියාකාරකම්
ඓතිහාසික වටිනාකමක් ඇති ශාකයක් ලෙස ගැනීමේදී බෝ ගස වැදගත් තැනක් ගනී. බුදුන් වහන්සේට බුදුවන්නට සෙවන ලබා දුන්නේ බෝ රුකයි.
එමෙන් ම සත්සතිය ගත කිරීමට ද වෘක්ෂ උපකාරී වී ඇත.
මෙම හේතූන් නිසා මිදෙල්ල රුක, අජපාල නුග රුක, කිරිපලු නුග රුක ආදී වශයෙන් ගෞරව නාම දී ඇත.
අප "ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ" යයි අමතන්නේ ද මෙයට ඇති අසීමිත ගෞරවය නිසාය.
Next

ක්‍රියාකාරකම්

# ඓතිහාසික වටිනාකමක් ඇති ශාක

- ආගමික හා සාහිත්‍ය, දේශපාලනික, සාමාජීය , ඇදහිලි ආදියට සම්බන්ධ ශාක රැසකි, බෝ, නා, නුග, කොහොඹ, සියඹලා ආදිය ඉන් ප්‍රධාන වේ.

- අනුරපුර ජය ශ්‍රී මහා බෝධිය, දෙනිපිටියේ නුග රුක, වල්ලි අම්මා කෝවිල අසල සියඹලා ගස ආදී ගස් ශ්‍රී ලාංකිකයන් අතර ජනප්‍රිය වූ ශාක ලෙස ගැනේ.

- දොඩම්ගස්තැන්න, පුවක්ගස්හන්දිය, කරඳගොල්ල, නාගස්හන්දිය, කැන්දලන්ද, බක්මී වැව ආදී නම් ශාක පදනම් කොට ගෙන නිර්මාණය වී ඇත.

- ඇතැම් පළාත්වල ගමන් බිමන් යාමේදී නුග ගසකින් අත්තක් කඩා දේව ආරක්ෂාව පතා එල්ලායාම සිරිතක්ව පවතී.

ක්‍රියාකාරකම්

# ශාක වලින් ඇති ප්‍රයෝජන

- ශාක අප අවට වාතය පිරිසිදු කරයි. අපට අවශ්‍ය ආහාර සපයයි.
- එනම් අවට පරිසරයේ ඇති අපිරිසිදු වාතය උරාගෙන පිරිසිදු වාතය පරිසරයට මුදා හරිනු ලබයි.
- අප අවට පරිසරයට සිසිලසක් ලබාදෙයි.
- අපට අවශ්‍ය ඖෂධ වර්ග ලබා දෙයි.
- වර්ෂාව ලබා දීමට උපකාරී වෙයි.
- ඉන්ධන ලබා දෙයි.
- නිවාස සහ ගෘහ භාණ්ඩ සෑදීමට අවශ්‍ය අමුද්‍රව්‍ය සපයයි.
- සතුන්ට ආහාර සහ ආරක්ෂාව හා සෙවන සපයයි.
- පසෙහි ජල ප්‍රමාණය වැඩි කරයි.



## හඳුනාගත් ශාක පත්‍ර 10 ඇඳ පැස්ටල් යොදාගනිමින් ක්‍රියාකාරකම කරන්න

* පත්‍ර නාරටි පිහිටි ඇති ආකාරය (එහි දී, ශාකයෙන් වැටී ඇති පත්‍රයක පිටුපස පැත්ත කඩදාසියක අච්චු ගසා සලකුණු කර ගැනීමට සිසුන් යොමු කරන්න.)





- ශාක පත්‍ර යොදාගෙන සමනලයකුගේ සත්ව ආකෘතියක් සුදු පසු බිමක නිර්මාණය කරන්න

ක්‍රියාකාරකම්

## ශාක පිළිබඳ ගායනා

ඇහැල මලින්

රබන් පද

උඩපල ගත්තත් වට්ටක්කා
බිමපල ගත්තත් වට්ටක්කා
උඩ පලගත්තත් බිම පලගත්තත්
පුංචි පුංචි ගෙඩි වට්ටක්කා

තුං තුඹ මල් තුනයි තුනයි
තිත්ත කැකිරි දෙකයි දෙකයි
තුං තුඹ මල් තුනට කපන්
තිත්ත කැකිරි දෙකට කපන්

පුංචි බතල ගැට තුඹකොළ
ළිඳ වටකර බහින බතල
ලොන්චි නැන්ද බඩ බැඳගෙන
තම්බල කන බිනර බතල

අත්තක සුදුමල්
අත්තක රතුමල්
පිපිච්ච මදුමල්
තකදොං පිපිච්ච මදුමල්

පිනවන දුටුදන

අත්ත සොඳයි

**කට පාඩම් කිරීමට දීම අවශ්‍ය නොවේ-රස වින්දනය සඳහා පමණි**


ශාක පිළිබඳ ගායනා
ක්‍රියාකාරකම්
ඇහැල මලින්
රබන් පද
අන්න සොඳයි තද වැස්සට ඉසලන්න
පිත්ත සොඳයි තද වරමදු අඹරන්න
ගොබේ සොඳයි දස ධර්මේ ලියවන්න
මේ මල සොඳයි බුදු මඟුලට ගෙනියන්න
අන්න බලාපන් අත්තක ඉඳ ලෝලු
පපුව පලාගෙන අඟනෙක් මද කාලු
කකා ගිය ලෙල්ල රසකර උයාලු
අද බැරිනම් හෙට තෝරාපන් යාලු
පිනවන දුටුදන
අන්න සොඳයි
විෂය සමගාමී අත්දැකීම් ලබාදීම සඳහා පමණක් යොදාගන්න.



නා ගස

උපුටා ගැනීම- අන්තර්ජාලය.

**K.G.JAYASINGHE.(I.S.A)**

DIVISIONAL EDUCATION OFFICE - RIDEEMALIYADDA

පරිසරයට පෙළ පොතක් නොමැති බැවින් දරුවාගේ නිවසට **share** කරන්න කාරුණික වන්න!

0712849634

# ස්තූතියි.